බුද්ධශාසන අමාත්‍යාංශය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව 154341

ශ්‍රී බු. ව. 2564 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2020

6 ශ්‍රේණිය

විභාග අංකය :

කාලය පැය 01 යි.

---

(i) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (ii) කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකටත් පමණක් පිළිතුරු සපයන්න.
(i) කොටස සඳහා ලකුණු (2 ×20) 40 කි. (ii) කොටස සඳහා ලකුණු (15×04) 60 කි.

I කොටස

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. අපේ බෝසතාණන් වහන්සේ ජෝතිපාල නමින් පැවිදි බවට පත්වූයේ කිනම් බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ද ?
   (i) විපස්සි බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ය.
   (ii) සිඛී බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ය.
   (iii) කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ය.
   (iv) ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ය.

02. **"ලෝකේ උස්සහවන්තානං ජනානං කිමසාධියං"** මෙය කාගේ ප්‍රකාශයක් ද ?
   (i) අනගාරික ධර්මපාලතුමාගේ ප්‍රකාශයකි. (ii) දුටුගැමුණු මහ රජතුමාගේ ප්‍රකාශයකි.
   (iii) මහා පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රකාශයකි. (iv) මහත්මා ගාන්ධිතුමාගේ ප්‍රකාශයකි.

03. අනුන් රැවටීමෙන් වැළකීමේ ගුණය මින් කුමක්ද ?
   (i) උජු ගුණය (ii) සුජු ගුණය
   (iii) සක්කෝ ගුණය (iv) සුවච ගුණය.

04. අපිරිසිදු වන සිත මැනවින් පිරිසිදු කරගත හැක්කේ කෙසේද ?
   (i) සිල් රැකීමෙනි. (ii) භාවනාවෙනි.
   (iii) නොසිතා සිටීමෙනි. (iv) දන් දීමෙනි.

05. බුදුරජාණන් වහන්සේ "අරහං" නමින් හඳුන්වන්නේ ඇයි ?
   (i) දත යුතු සියල්ල මැනවින් දත් නිසා ය. (ii) තමා ම සියල්ල අවබෝධ කරගත් නිසා ය.
   (iii) දෙව් මිනිසුන්ට ගුරු වන නිසා ය. (iv) සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ නිසා ය.

06. උපාලි තෙරණුවෝ විනයධර භික්ෂූන් වහන්සේලා අතර අග්‍රතනතුරට පත් වූයේ අතීත බුදුසසුනක දී කළ ප්‍රාර්ථනාවකට අනුව ය. ඒ ප්‍රාර්ථනාව කළේ කිනම් බුදුරජාණන් වහන්සේ අභියස දී ද ?
   (i) පදුමුත්තර බුදුරජාණන් වහන්සේ අභියසදී ය. (ii) අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ අභියසදී ය.
   (iii) දීපංකර බුදුරජාණන් වහන්සේ අභියසදී ය. (iv) පදුම බුදුරජාණන් වහන්සේ අභියසදී ය.

07. උපාලි තෙරණුවන් විසින් විනය සම්බන්ධ සියලු ප්‍රශ්න විසඳාලූයේ කීවැනි ධර්ම සංගායනාවේදී ද ?
   (i) දෙවන ධර්ම සංගායනාවේදී ය. (ii) පළමු ධර්ම සංගායනාවේදී ය.
   (iii) තෙවන ධර්ම සංගායනාවේදී ය. (iv) සිව්වන ධර්ම සංගායනාවේදී ය.

08. ලෝවැඩ සඟරාව යනු .....
   (i) උපහාර කාව්‍යයකි. (ii) වීර කාව්‍යයකි.
   (iii) උපදේශ කාව්‍යයකි. (iv) ප්‍රශස්ති කාව්‍යයකි.

09. රණස්ගල්ලේ හිමියන්ගේ කාව්‍ය නිර්මාණය මින් කුමක් ද ?

(i) සුභාෂිතය (ii) සිරිත් මල් දම

(iii) හිතෝපදේශය (iv) ලෝකෝපකාරය

10. ලෝකෝපකාර කතුවරයා විසින් සම්පූර්ණ දිවක් ඇතත් කතා කළ නොහැකි ගොළුවාට උපමා කර ඇත්තේ මින් කවර පුද්ගලයා ද ?

(i) ලෝභී පුද්ගලයා ය. (ii) මෝඩ පුද්ගලයා ය.

(iii) අන්ධ පුද්ගලයා ය. (iv) රෝගී පුද්ගලයා ය.

11. ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණ තුනෙන් එකක් නොවන්නේ මින් කුමක්ද ?

(i) බණ ඇසීම (ii) දන්දීම

(iii) සිල්වතුන් දැකීම (iv) භාවනා නොකිරීම

12. දන් දීමේදී යටපත් කරගතයුතු ප්‍රධාන අකුසල චේතනා ගණන කීයද ?

(i) 02 කි. (ii) 08 කි.

(iii) 03 කි. (iv) 04 කි.

13. බුද්ධත්වයට පත් වීමෙන් පසු බුදුරජාණන් වහන්සේ අභිධර්මය මෙනෙහි කළේ කීවැනි සතියේ ද ?

(i) පළමු සතියේ දීය. (ii) දෙවන සතියේ දීය.

(iii) සිව්වන සතියේ දීය. (iv) පස්වන සතියේ දීය.

14. යමක් කිරීමට ස්ථිරව සිතාගැනීම ......

(i) අධිෂ්ඨානය යි. (ii) තීරණය යි.

(iii) සම්මුතිය යි. (iv) නීතිය යි.

15. පළමුවෙන් ම බුද්ධ රත්නයේ සහ ධර්ම රත්නයේ සරණ ගියේ ......

(i) පස්වග තවුසන් ය. (ii) බරණැසේ සිටුවරයා ය.

(iii) යස කුලපුත්‍රයා ය. (iv) තපස්සු භල්ලුක දෙදෙනා ය.

16. "මට ගුරුවරයෙක් නැත, මා හා සමාන වූවෙක් නැත, මම ලොවෙහි උතුම් ශාස්තෘවරයා වෙමි, සම්මා සම්බුද්ධ වෙමි" යි බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ හඳුන්වා දුන්නේ කාහට ද ?

(i) සොත්ථිය බමුණාට ය. (ii) උපක ආජීවකයාට ය.

(iii) හුහුංක බමුණාට ය. (iv) බිම්බිසාර රජතුමාට ය.

17. කොණ්ඩඤ්ඤ තාපසතුමා සෝවාන් ඵලයට පත්වූයේ මෙම සූත්‍ර දේශනාව ඇසීමෙනි.

(i) මහා සමය සූත්‍රය (ii) ආනාපාන සති සූත්‍රය

(iii) ධම්මචක්කප්පවත්තන සූත්‍රය (iv) අනත්තලක්ඛණ සූත්‍රය

18. භාරත ඉතිහාසයේ සඳහන්වන පරිදි ධර්මාශෝක රජතුමාගේ රාජ්‍ය සමයට පෙර ථෙරවාදී ධර්ම සංගායනා කීයක් පවත්වා තිබේ ද ?

(i) එකකි. (ii) තුනකි.

(iii) හතරකි. (iv) දෙකකි.

19. ළදරු සිදුහත් කුමාරයා විසින් වප් මඟුල් ද වැඩූයේ කිනම් භාවනාව ද ?

(i) මෛත්‍රී භාවනාව (ii) බුද්ධානුස්සති භාවනාව

(iii) ආනාපානසති භාවනාව (iv) අසුභ භාවනාව

20. පොළොන්නරු කතිකාවත සම්පාදනය කරවූයේ කිනම් රජතුමා විසින් ද ?

(i) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි. (ii) මහා විජයබාහු රජතුමා විසිනි.

(iii) නිශ්ශංකමල්ල රජතුමා විසිනි. (iv) දෙවන පරාක්‍රමබාහු රජතුමා විසිනි.

(ලකුණු 02×20 = 40)

## II කොටස

01. හිස්තැන් පුරවන්න.

(i) බුදුහාමුදුරුවෝ ........................................ කරන දේ කියන යථාවාදී තථාකාරී ................................ ගුණයෙන් යුක්ත යි.

(ii) අපිරිසිදු වූ ඇඳුම් පැළඳුම් පිරිසිදු කරන්නාක් මෙන් අපිරිසිදු ........................ ද පිරිසිදු කරගත යුතුය. සිත පිරිසිදු කරගත් යුත්තේ ........................................

(iii) විනය වූකලී බුදුසසුනේ ........................................ යන්න තහවුරු කරමින් බුදුසසුන චිරාත් කාලයක් පවත්වාගෙන යාමට ........................................ වහන්සේගෙන් සිදුවූයේ උදර මෙහෙවරකි.

(iv) දස්සනකාමෝ සීලවතං - ........................................

විනෙයය මච්ඡේර මලං - ........................................

(v) උග්‍ර තවුස්දම් පිරීමෙන් ........................................ ලද නොහැකි බව වටහාගත් බෝසතාණන් වහන්සේ ........................................ පිළිපන්හ.

(ලකුණු 15)

02. (i) දහම් පාසල් අධ්‍යාපනය මගින් දරුවකු තුළ ගොඩනැගෙන යහපත් ගති ලක්ෂණ පහක් නම් කරන්න.

(ලකුණු 05)

(ii) දහම් පාසල් අධ්‍යාපනය ලැබීමේ වටිනාකම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. (i) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු පළමු සති හත ගතකළ ආකාරය දක්වන්න.

(ලකුණු 05)

(ii) සත් සති ගතකිරීමෙන් අනතුරුව පස්වග තවුසන් ධර්මාවබෝධය ලබන තෙක් බුද්ධ චරිතයේ එන වැදගත් අවස්ථා කරුණු වශයෙන් සඳහන් කරන්න. (ලකුණු 10)

04. (i) "සංගායනා" යන්නෙහි අර්ථය පැහැදිලි කර, ප්‍රථම ධර්ම සංගායනාවට පසුබිම් වූ ආසන්නම සිදුවීම සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) දස අකැප වස්තු නම් කරන්න. (ලකුණු 10)

05. (i) **යෝ ච පුබ්බෙ පමජ්ජිත්වා** - යන ගාථාව නිවැරදිව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 05)

(ii) මෙම ගාථාවෙහි අර්ථය පැහැදිලි කර එම ගාථාව හා සම්බන්ධ සිදුවීම ද කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 10)

06. (i) මහා විජයබාහු රජතුමාගේ ශාසනික සේවාව ඇගයුමට ලක්කරන්න. (ලකුණු 05)

(ii) තම රටවැසියාගේ සදචාර සංවර්ධනය සඳහා සහ භෞතික දියුණුව සඳහා මහා පරාක්‍රමබාහු රජතුමා ඉටුකළ මෙහෙය සඳහන් කරන්න. (ලකුණු 10)

බුද්ධ ශාසන අමාත්‍යාංශය - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී.බු.ව 2564 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2020

**06 - ශ්‍රේණිය** — **පිළිතුරු පත්‍රය**

(I) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (II) කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකටත් පමණක් පිළිතුරු සපයන්න.
(I) කොටස සඳහා ලකුණු (2 × 20) 40 කි (II) කොටස සඳහා ලකුණු (15 × 04) 60 කි.

මූලාශ්‍රය - 06 ශ්‍රේණිය පෙළ පොත

I - කොටස

**01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

| ප්‍රශ්න අංකය | පිළිතුර | පිටු අංකය | ඡේදය/ කරුණ /පාඨය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | (III) කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ය. | 03 | 02 | 02 |
| 02 | (III) මහා පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රකාශයකි. | 07 | 02 | 02 |
| 03 | (I) උද්‍ර ගුණය | 07 | 04 | 02 |
| 04 | (II) භාවනාවෙනි. | 10 | 05 | 02 |
| 05 | (IV) සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ නිසා ය. | 12 | 10 | 02 |
| 06 | (I) පදුමුත්තර බුදුරජාණන් වහන්සේ අභියසදී ය. | 16 | 05 | 02 |
| 07 | (II) පළමු ධර්ම සංගායනාවේදී ය. | 17 | 03 | 02 |
| 08 | (III) උපදේශ කාව්‍යයකි. | 19 | 01 | 02 |
| 09 | (IV) ලෝකෝපකාරය | 19 | 01 | 02 |
| 10 | (I) ලෝභී පුද්ගලයා ය. | 19 | 05 | 02 |
| 11 | (IV) භාවනා නොකිරීම | 23 | 08 | 02 |
| 12 | (III) 03 කි. | 24 | 05 | 02 |
| 13 | (III) සිව්වන සතියේදී ය. | 27 | 02 | 02 |
| 14 | (I) අධිෂ්ඨානය යි. | 26 | 02 | 02 |
| 15 | (IV) තපස්සු භල්ලුක දෙදෙනා ය. | 27 | 02 | 02 |
| 16 | (II) උපක ආජීවකයාට ය. | 28 | 05 | 02 |
| 17 | (III) ධම්මචක්කප්පවත්තන සූත්‍රය | 29 | 01 | 02 |
| 18 | (IV) දෙකකි. | 31 | 01 | 02 |
| 19 | (III) ආනාපානසති භාවනාව | 37 | 01 | 02 |
| 20 | (I) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි. | 48 | 03 | 02 |

| II - කොටස | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01 | (I) | කියන දේ කරන | යථාකාරී තථාවාදී | 07 | 03 | 03 |
| | (II) | සිත | භාවනා කිරීමෙනි | 10 | 05 | 03 |
| | (III) | ආයුෂය | උපාලි මහරහතන් | 17 | 03 | 03 |
| | (IV) | සද්ධම්මං සෝතුමිච්ඡති<br>සබ්බේ සද්ධෝති වුච්චති | | 24 | 02 | 03 |
| | (V) | විමුක්තිය | මැදුම් පිළිවෙතට | 26 | 02 | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | (I) | තෙරුවන් වැඳීම, ගුරු දෙගුරුන් නැමදීම, වැඩිහිටියන්ට සැලකීම, දුසිරිත්වලින් තොරවීම, යහපත් ගුණ වැඩීම, ශ්‍රද්ධාවන්ත කම, වැඩිහිටි උපදෙස් පිළිපැදීම, සත්පුරුෂ ඇසුර, දන්දීම, සිල් රැකීම, භාවනා කිරීම, ආදිය...... | 01 | | [illegible] |
| | (II) | පළමුවන පාඩමේ සඳහන් වන කරුණු ද පදනම් කරගෙන දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම හය වසරේ දරුවන් මේවනවිට වටහාගෙන ඇති ආකාරය ප්‍රකට වන සරල පිළිතුරක් අපේක්ෂා කෙරේ. | 01 | | 10 |
| 03 | (I) | පළමු සතිය බෝ මැඩ අසල විමුක්ති සුවයෙන් ගතකිරීම. දෙවන සතිය කළගුණ දක්වනු වස් බෝධීන් වහන්සේට අනිමිස ලෝචන පූජාව පැවැත්වීම. තෙවන සතිය සක්මන් කිරීම, සිව්වන සතිය රුවන් ගෙහි සිට අභිධර්මය මෙනෙහි කිරීම, පස්වන සතිය අජපාල නුග රුක මුල වැඩ හිඳිමින් තමන් වහන්සේ සොයාගත් ධර්මය ගුරු තනතුරෙහි තබා ගැනීම, සයවන සතිය මිදෙල්ල රුක මුල මුචලින්ද නා රජුගේ ආවරණය යට කල්ගත කිරීම, සත්වන සතිය රාජායතන කිරුපලු රුක මුල වැඩ හිඳීම | 27 | 02 | 05 |
| | (II) | • සති හත අවසානයේ, මා අවබෝධ කරගත් ධර්මය ඉතා ගැඹුරුය, අවබෝධ කර ගැනීම අපහසුය...... එය ලෝකයාට දේශනා කිරීම හුදෙක් මට වෙහෙස ගෙනදෙන්නක් පමණක් වේද ... යන අදහස පහළ වීම.<br>• අනතුරුව බුදු ඇසින් ලොව බැලීම. එහිදී මිනිස් සමාජය නෙළුම් විලක් සේ දැකීම. (ජලයෙන් මතු වී පිපී ඇති මල්, ජලයෙන් මතුවෙමින් තිබෙන මල්, ජලය තුළ ඇති පොහොට්ටු ආදිය මෙන් කෙලෙස් අඩු වැඩි මිනිසුන් සමාජය තුළ සිටින බව)<br>• අනතුරුව දම් දෙසීමට තීරණය කරගැනීම,<br>• පළමුව කාට දම් දෙසම් දැයි බලන විට පූර්ව ආචාර්යවරු කළුරිය කර තිබුණෙන් පස්වග තවුසන් සොයා බරණැස ඉසිපතනය කරා වැඩම කරවීම.<br>• බරණැසට යන අතර මග දී උපක නම් ආජීවකයා මුණගැසීම හා තමන් වහන්සේ කවුද යන්න හඳුන්වා දීම.<br>• දිගු මගක් ගෙවා බරණැසට පැමිණීම.<br>• පස්වග තවුසන් හමුවීම<br>• ඔවුන් මුලදී අවිශ්වාස කිරීම නිසා තමන් කවුද යන්න වටහා දීමට සිදුවීම,<br>• පසුව තමා අවබෝධ කරගත් දහම ඔවුන්ට දේශනා කිරීම. එය ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව යි.<br>• දේශනාව අවසානයේ කොණ්ඩඤ්ඤ තාපසතුමා සෝවාන් වීම. උන්වහන්සේ ගෞතම ශාසනයේ පළමු ශ්‍රාවකයා බවට පත්වීම.<br>• අනතුරුව සෙසු සිවුදෙනා ද සෝවාන්ව පැවිදි බව ලබා ගැනීම.<br>• අනත්තලක්ඛන සූත්‍රයේ ඇතුළත් දහම් කරුණු අසා පස්දෙනා වහන්සේ ම රහත් ඵලයට පත්වීම. | 27<br>-<br>29 | | 10 |
| 04 | (I) | සංගායනා යන්නෙහි අර්ථය සාමූහිකව කියවීම යන්න යි. භික්ෂූන් වහන්සේලා එකතුවී බුදුරජාණන් වහන්සේ වදාළ ධර්ම විනය සියල්ලන් ඉදිරියේ කියවා පොදුවේ මේ බුද්ධ දේශනයයි කියා සම්මුතියකට එළඹීම ධර්ම සංගායනා ලෙස හැඳින් වේ.<br><br>සුභද්‍ර නම් භික්ෂුව විසින් බුද්ධ පරිනිර්වාණය හැඬීමට, වැලපීමට හේතුවක් නොවන බවත්, දැන් අපි නිදහස් බවත්, මෙතෙක් කලක් නීති රීති වලට යටත්ව පීඩා විඳි බවත්, දැන් කැමති දේ කළහැකි බවත්, අකමැති දේ නොකළ හැකි බවත් ප්‍රකාශ කරමින් අගතිගාමී මතයක් පැතිරවීම. | 31 | 02<br>-<br>03 | 05 |
| | (II) | 1. සිංගිලෝණ කප්ප<br>2. ද්වංගුල කප්ප<br>3. ගාමන්තර කප්ප<br>4. ආවාස කප්ප<br>5. අනුමති කප්ප<br>6. ආචිණ්ණ කප්ප<br>7. අමථිත කප්ප<br>8. ජලෝගි කප්ප<br>9. අසදක නිසීදන කප්ප<br>10. ජාත රූප රජත පටිග්ගහන කප්ප | 33<br>34 | 04<br>01 | 10 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | (I) | යෝ ච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සෝ නප්පමජ්ජති<br>සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝ ව චන්දිමා | 54 | 04 | 05 |
| | (II) | අනුවණ විලස වැඩ කරමින් පමා කොට - සිටිය අයකු පසු සිහි උපදවා සිට<br>වැඩ කළහොත් මුළු ලෝකය පුබුදු කොට - සඳ මෙන් බබලවයි වැහිකළු ඉවත් කොට<br><br>බුද්ධ කාලයේ සම්මුඤ්ජනි නම් පොඩි හාමුදුරු නමක් වැඩසිටියා. උන්වහන්සේගේ කාලය වැඩිපුර ගත වුයේ මළුව ඇමදීමට යි. එමෙන් ම අනෙකුත් භික්ෂූන් වහන්සේලා මළු පෙත් ඇමදීමෙන් වලකින බව කියමින් දොස් නගන්නටත් වුණා. දිනක් රේවත හාමුදුරුවෝ සම්මුඤ්ජනි හාමුදුරුවෝ ඇතුලු සියලුම භික්ෂූන් වහන්සේලාට නියම කළා කාලය වෙන් කරගෙන අතුපතු ගැමටත් අනෙක් වෙලාවට භාවනා කරන්නටත් කියල. මේ අවවාදය පිළිගත් සම්මුඤ්ජනි පොඩි හාමුදුරුවෝ භාවනා කරල කෙටි කලකින් ම රහත් වුණා.<br><br>මේ සිද්ධිය මුල් කරගෙන බුදුහාමුදුරුවෝ සැමට දුන් උපදේශය තමයි මුලදී අඩුපාඩුකම් සහිත ජීවිතයක් ගතකලත් පසුව පසුව නිවැරදි ජීවිතයකට හුරුවුවහොත් ඒ තැනැත්තා වලාකුලින් මිදුන සඳවගේ ලෝකය බබලවන බව ඉහත ගාථාවෙ තිබෙන්නේ | 54<br>55 | 05<br>02 | 10 |
| 06 | (I) | උපසම්පදා භික්ෂූන් වහන්සේලා පස් නමක් සොයා ගැනීමට නොහැකිව තිබූ පසුබිමක මියන්මාරයෙන් උපසපන් භික්ෂූන් වහන්සේලා 20 නමක් වඩමවා මෙරට භික්ෂු උපසම්පදාව යළි ඇතිකිරීමට කටයුතු කිරීම.<br>මියන්මාරයට පාලි ත්‍රිපිටක පොත් යැවීම.<br>පාලි ත්‍රිපිටක පොත් මෙරට භික්ෂූන් වහන්සේලාට පූජා කිරීම<br>වටදාගෙය නමින් දළදා මාළිගාවක් පොළොන්නරුවේ ඉදිකරවීම.<br>දළදා පූජෝත්සව පැවැත්වීම.<br>සිරිපා වන්දනා මාර්ගය පිළිසකර කරවීම.<br>සිරිපා වන්දනාවේ යන අයගේ සුව පහසුව පිණිස රත්නපුර ගිලීමලේ ගමේ ආදායම පවරා දීම.<br>සොළීන් විනාශ කළ විහාරස්ථාන යළි ගොඩනැගීම සඳහා සෙල්ලිපි මගින් විහාර ගම් පූජා කිරීම.<br>මෙතුමා සතර පෝයටම සිල් ගත් සැදැහැවත් උපාසකයෙකි. භික්ෂූන්ට සිවුපසයෙන් උපස්ථාන කළ කුලූපග දායකයෙකි. ධර්මකාමියෙකි. ධර්ම ග්‍රන්ථ කතුවරයෙකි.<br>*(මෙම කරුණු අතුරින් කරුණු පහක් හෝ සඳහන් කරමින් මහා විජයබාහු රජතුමාගේ සේවය අගයා ඇතිනම් ලකුණු 05 ක් ලබා දෙන්න)* | 46<br>47 | 04<br>1-3 | 05 |
| | (II) | පොළොන්නරුව රාජධානිය බවට පත්කරගෙන සිරිලක අගරජ බවට පත්වීම.<br>සතර පොහොයට සිල් සමාදන් වීම,<br>පොහෝ දිනවල සවස ආරෝග්‍ය ශාලාවට ගොස් රෝගීන්ගේ සුව දුක් විමසා බැලීම,<br>රෝහලෙන් පිටව යන අයට ද පහසුකම් සැලසීම,<br>මානව දයාවෙන් යුතුව කටයුතු කිරීම,<br>තුන් නිකායික භික්ෂූන් වහන්සේලා සමගි කරවා කතිකාවතක් පිළියෙළ කරවීම,<br>ගල් විහාරය ඇතුළු වෙහෙර විහාර රාශියක් ඉදිකරවීම,<br>ආලාහන පිරිවෙණ ඇතුලු පිරිවෙන් 75 ක් කරවීම,<br>මව් ගුණ සිහිකරමින් ඇදිගම කොටවෙහෙර හෙවත් සුතිඝර දාගබ ගොඩනැගීම.<br>වැවයි දාගැබයි සංකල්පය උසස් ම තැනට ගෙන එමින් ආර්ථික දියුණුව හා සදාචාර දියුණුව ඇති කරවීම.<br>අහසින් වැටෙන සෑම දිය බිඳුවම නැවත ප්‍රයෝජනයට ගතහැකි වන සේ පරාක්‍රම සමුද්‍රය ඇතුලු මහ වැව් 163 ක්, කුඩා වැව් 2376 ක්, අමුණු 165 ක්, ඇළමාර්ග 3910 ක් ද අලුතින් තැනීම හා ප්‍රතිසංස්කරණය කරවීම සිදු කරවීම.<br>ගොවිතැනින් මෙරට ස්වයං පෝෂිත කරවීම.<br>විදේශ රටවලට පවා සහල් අපනයනය කිරීම.<br>මේ අයුරින් ආර්ථික සංවර්ධනය මගින් භෞතික දියුණුවත්, ආගමික පුනරුදය මගින් සදාචාර සංවර්ධනයත් ඇතිකරවීමට පරාක්‍රමබාහු රජතුමා කටයුතු කළේය. | 48<br>49 | | 10 |